(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(10).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2016 නොවැම්බර් මස 19 වැනි සෙනසුරාදා**

---

## 2016 නොවැම්බර් මස 26 වැනි සෙනසුරාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විදේශ කටයුතු අමාත්‍යතුමා,— තානාපති වරප්‍රසාද පනත යටතේ නියමය,— 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2016 ඔක්තෝබර් 05 දිනැති අංක 1987/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.11.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නිර්දේශ මත විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 13 දිනැති අංක 1975/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.11.11 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා,— ගෙවල් කුලී පනත යටතේ නියෝග,— 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 2 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 43 වැනි වගන්තිය යටතේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අගෝස්තු 01 දිනැති අංක 1978/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.11.18 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

* සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.

---

## 2016 දෙසැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

579/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 වනවිට ශ්‍රී ලංකාවේ කොකෝවා වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) 2010 සිට 2015 දක්වා වසර පහ තුළ කොකෝවා නිෂ්පාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කිලෝග්‍රෑම් කොපමණද;

(iii) රජය විසින් ගොවීන්ගෙන් සෘජුවම කොකෝවා මිලදී ගන්නේද;

(iv) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජය විසින් මිලදී ගත් කොකෝවා ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොකෝවා නිෂ්පාදනය ඉහළ දැමීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

944/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට "විදුලක්පාය" නමින් නව මූලස්ථානයක් ඉදිකිරීම සඳහා 2012 වසරේදී එවකට විදුලිබල අමාත්‍යවරයා විසින් මුල්ගල තැබූ බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතියට මේ දක්වා වියදම් කළ සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය වෙනුවෙන් බඳවා ගනු ලැබූ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ගොඩනැගිල්ල විවෘත කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

967/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.05.19 වැනි දිනට යාපනය දිස්ත්‍රික්කයේ තිබූ මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසැල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂයන්හි අලුතින් විවෘතකර ඇති මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව, එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(v) මේ වනවිට යාපනය දිස්ත්‍රික්කය තුළ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

977/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තාක්ෂණවේදය විෂයධාරාවෙන් උසස් පෙළ අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාලවලට ඇතුළත්වන සිසුන් සඳහා මේ වනවිට හඳුන්වාදී ඇති උපාධි පාඨමාලා කවරේද;

(ii) විශ්වවිද්‍යාලවල විවෘත කර ඇති තාක්ෂණවේද පීඨ සංඛ්‍යාව කොපමණද; ඒවා කවරේද;

(iii) රජයේ කාර්මික විද්‍යාලවල දැනට ක්‍රියාත්මකවන තාක්ෂණවේදයට අදාළ උසස් ඩිප්ලෝමා සහතිකය සහ ඉහත විශ්වවිද්‍යාලවල තාක්ෂණවේද පීඨ මඟින් ලබාදෙන උපාධි සහතිකය අතර වෙනස කවරේද;

(iv) තාක්ෂණවේදී උපාධිය මූලික සුදුසුකම ලෙස කවර මට්ටමේ රැකියා සඳහා සලකනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල මඟින් දැනට මෙම තාක්ෂණවේදී උපාධිධාරින් සඳහා උසස් ප්‍රමිතියක් සහිත විශේෂ පාඨමාලා සකස්කර තිබේද;

(ii) එසේ නම්, එම පාඨමාලා කවරේද;

(iii) තාක්ෂණවේදී උපාධිධාරින්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා රජය දැනට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1010/'16

ගරු නාමල් රාජපක්ෂ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දක්වා ඉදිකිරීමට යෝජිත අධිවේගී මාර්ගයේ ඉඩම් අත් කරගැනීම් අවසන්කර තිබේද;

(ii) එම ඉඩම් සඳහා වන්දි තක්සේරුකර තිබේද;

(iii) එසේ නම්, වන්දි මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් ඉඩම් අයිතිකරුවන් වශයෙන් හඳුන්වනු ලබන, අනවසර පදිංචිකරුවන්, බලපත්‍රලාභීන් සහ සින්නක්කර ඔප්පුහිමියන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරි වසම් අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (ii)හි සඳහන් පුද්ගලයන් අතරින් මේ වනවිට වන්දි මුදල් ගෙවා ඇති සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඉහත (ii)හි සඳහන් පුද්ගලයන් අතරින් මේ වනවිට වන්දි මුදල් ගෙවා නොමැති සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) ඉහත (iv)හි සඳහන් පුද්ගලයන්ට වන්දි මුදල් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉවත් කරනු ලබන අනවසර පදිංචිකරුවන්ට ඉඩම් කොටසක් ලබා දෙන්නේද;

(ii) ඔවුන්ට නිවසක් ඉදිකර ගැනීමට සරිලන වන්දි මුදලක් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1022/'16

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රජරට ප්‍රදේශයේ බහුලව ව්‍යාප්ත වී ඇති වකුගඩු රෝගය මේ වනවිට කොළඹ, ගම්පහ වැනි නාගරික ප්‍රදේශවලටද සංක්‍රමණය වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල වකුගඩු රෝගය බහුල වීමට බලපා ඇති හේතු කවරේද;

(ii) ගම්පහ දිස්ත්‍රික්කයේ හඳුනාගෙන ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) හඳුනාගෙන ඇති රෝගීන්ගේ රෝග නිවාරණය සඳහා අනුගමනය කරන විශේෂ සෞඛ්‍ය වැඩසටහන් කවරේද;

(iv) තවදුරටත් මෙම ප්‍රදේශවල වකුගඩු රෝගය ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1024/'16

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල ගොවීන් මුහුණදෙන ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා මේ වනතෙක් කෘෂිකර්ම විනිශ්චය සභා පත් කර නොමැති බව දන්නේද;

(ii) උක්ත කරුණ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යවරයා සහ ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්වරයා අමතන ලද 2016.04.04 දිනැති ලිපියෙන් දැනුම්දුන් මවිසින් කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන තිබේද;

(iii) එසේ නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) උතුරු සහ නැගෙනහිර පළාත්වල කෘෂිකර්ම විනිශ්චය සභා පිහිටුවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 දෙසැම්බර් මස 02 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

833/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙමළ කථා කරන ජනතාවට සිංහල භාෂාව ඉගැන්වීමටත්, සිංහල කතා කරන ජනතාවට දෙමළ භාෂාව ඉගැන්වීමටත් ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) පාසල් හැර ගිය රැකියා විරහිත පිරිසට, රජයේ සේවකයන්ට හා පෞද්ගලික අංශයේ සේවකයන්ට දෙමළ හා සිංහල භාෂාව ඉගැන්වීමට පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ඉගැන්වීමේ කාර්යයන් සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් සිටින්නේද;

(ii) එසේ නම්, එම ගුරුවරුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iii) නොඑසේ නම්, ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සිංහල හා දෙමළ භාෂා ඉගැන්වීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, එම මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

968/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.05.19 වැනි දිනට කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ තිබූ මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසැල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂයන්හි අලුතින් විවෘතකර ඇති මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව, එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(v) මේ වනවිට කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

986/'16

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුළං බලය මඟින් සහ සූර්ය බලය මඟින් විදුලිය උත්පාදනය කිරීමේදී එම විදුලිය මිලදී ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) සුළං බලය සහ සූර්ය බලය ඇසුරෙන් උත්පාදනය කරන විදුලිය තරඟකාරී සහ විවෘත ටෙන්ඩර් පටිපාටියක් මඟින් මිලදී ගැනීම සිදු කළ නොහැකිද;

(iii) සූර්ය බලශක්ති උද්‍යාන (Solar Park) සහ සුළං බලශක්ති උද්‍යාන (Wind Park) යන ලෝකයේ ප්‍රකට ලෙස භාවිතා වන ක්‍රමවේද භාවිතා කරමින් විදුලිය උත්පාදනය කිරීම සහ එම විදුලිය ලංකා විදුලිබල මණ්ඩලය මඟින් මිලදී ගැනීම ලංකා විදුලිබල මණ්ඩලයට සහ රටට වඩාත් ලාභදායී නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

994/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 සැප්තැම්බර් 24 දින යුද හමුදා රෝහලට ආධාර පිණිස "වායු" නමින් සංගීත සංදර්ශනයක් පැවැත්වීමට කටයුතු කර තිබූ බවත්;

(ii) එකී සංදර්ශනය සඳහා යුද හමුදා රෝහලේ සේවය කරන මේජර් සහ ඉහළ නිල දරන නිලධාරින්ට රු. 7,500/- ප්‍රවේශපත්‍ර දෙකක් ද, සෙසු නිල දරන නිලධාරින්ට රු. 7,500/- ප්‍රවේශපත්‍රයක් ද මිලදී ගැනීම අනිවාර්ය කර තිබූ බවත්;

(iii) එවැනි ඉහළ මුදලක් ගෙවීමට නොහැකි වීමෙන් නිලධාරින් අසීරුතාවයට පත් වූ බවත්;

එතුමා දන්නෙහිද;

(ආ) එසේ බලහත්කාරයෙන් ලබා ගත් මුදල් නැවත නිලධාරීන්ට ගෙවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1023/'16

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ප්‍රබල සමාජ ව්‍යසනයක් වී ඇති වකුගඩු රෝගයෙන් පීඩා විඳින රෝගීන් වෙනුවෙන් ක්‍රියාත්මක වන වකුගඩු රෝගී ආධාර වැඩසටහන ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මෙම වර්ෂයට වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) මේ වනවිට වන්දි ප්‍රදානය කර ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉදිරියේදී වන්දි ගෙවීමට සැලසුම් කර ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් වැඩසටහන ගම්පහ දිස්ත්‍රික්කය තුළ මේ වනවිට ක්‍රියාත්මක නොවේ නම්, ඉදිරියේදී එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iii) මෙම වැඩසටහන පිළිබඳව එම ප්‍රදේශවල සාමාන්‍ය ජනතාව දැනුවත් නොමැති බැවින්, සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් පුළුල් ප්‍රචාරයක් ලබා දී අදාළ ජනතාව තවදුරටත් දැනුවත් කිරීමට ක්‍රියාමාර්ගයක් ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයකින්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1025/'16

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව්, වව්නියා සහ මන්නාරම දිස්ත්‍රික්කවල පශු සම්පත් සඳහා වූ තෘණබිම් සඳහා වෙන් කොට ඇති ඉඩම් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මුලතිව් ප්‍රදේශයේ පශු සම්පත් සඳහා වූ තෘණබිම් ලෙස ප්‍රකාශයට පත්කොට ඇති ඉඩම් මුදා ගැනීමට වන ජීවී ආරක්ෂක අංශය විසින් අවසර දීම ප්‍රතික්ෂේප කරමින් සිටින බව දන්නේද;

(iii) පශු පාලනයේ නිරතවන්නන් මුහුණ දෙන ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමක් වශයෙන් තෘණබිම් ලෙස වෙන්කොට තිබෙන ඉඩම්, වන ජීවී ආරක්ෂක අංශයෙන් මුදවාගෙන පශු පාලනයේ නිරතවන්නන්ගේ ප්‍රයෝජනය සඳහා ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1103/'16

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුරු විද්‍යාලයන්හි ගුරු අභ්‍යාසලාභීන් 41 දෙනකු 2008 දෙසැම්බර් මාසයේදී අවසාන විභාගය පැවැත්වීමකින් තොරව පුහුණුව අවසන් කළ වහාම 2009 ජනවාරි මාසයේදී වන්නි දිස්ත්‍රික්කයට පත්කරනු ලැබූ බවත්;

(ii) ඔවුන්ට සිය විභාගයට පෙනී සිටීම සඳහා 2009 අප්‍රේල් මාසයේදී සිය ගුරු අභ්‍යාස විද්‍යාලවලට පැමිණෙන ලෙස ඉල්ලා සිටිනු ලැබූ බවත්;

(iii) එම චකවානුව යුද්ධයේ උච්ඡතම අවස්ථාවවීම හේතුවෙන් කිසිවකුටත් වන්නි දිස්ත්‍රික්කයෙන් පිටවීමට අවසර දෙනු නොලැබූ බවත්;

(iv) ඔවුන් තම කණිෂ්ඨ ශිෂ්‍ය කාණ්ඩායම සමග එකවර විභාගයට පෙනී සිට එම ප්‍රශ්නපත්‍රයටම පිළිතුරු ලියූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන් එකම දින විභාගයට පෙනී සිට එකම ප්‍රශ්නපත්‍රයට පිළිතුරු ලියූ බැවින් ඔවුන්ගේ ඩිප්ලෝමා සහතිකවල ක්‍රියාත්මක දිනයන් දෙකක් දී තිබීමට හේතුව කුමක්ද;

(ii) කණිෂ්ඨ ශිෂ්‍ය කාණ්ඩායම ක්‍රියාත්මක දිනයම ලබා දෙන ලෙස එතුමා උපදෙස් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2016 දෙසැම්බර් මස 03 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

834/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගංජා, අබින්, මත්පෙති, ඖෂධ සිරප්, මදනමෝදක හා ඒ හා සමාන මත්ද්‍රව්‍ය සමාජය තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්තවී ඇති බවත්;

(ii) මෙම මත්ද්‍රව්‍ය වෙළඳාම පාසල් තුළද ව්‍යාප්තවී ඇති බවත්;

(iii) පාසල් සිසුන්ද මේ සඳහා ඇබ්බැහිවීමේ ප්‍රවණතාවක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත මත්ද්‍රව්‍යයන්ට අමතරව, පාසල් ආශ්‍රිතව භාවිතාවන බවට වාර්තා වී ඇති වෙනත් මත්ද්‍රව්‍ය වර්ග කවරේද;

(ii) 2014 හා 2015 යන වර්ෂයන්හිදී පාසල් ආශ්‍රිතව මත්ද්‍රව්‍ය වෙළඳාම් කළ හා ඊට සම්බන්ධ පාසල් සිසුන් අත්අඩංගුවට ගැනීම් සිදුකර තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම සිසුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පාසල් තුළට මත්ද්‍රව්‍ය ව්‍යාප්තවීම වැළැක්වීමට ගෙන ඇති වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඒ සම්බන්ධව පසු විපරම් කිරීමක් සිදුකරන්නේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

906/’16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වැනි ශ්‍රේණියට නිලධාරින් බඳවා ගැනීම සඳහා 2016.07.22 වැනි දින ගැසට් පත්‍රය මඟින් අයදුම්පත් කැඳවා තිබේද;

(ii) එම නිලධාරින් බඳවා ගැනීම සඳහා ඉල්ලා ඇති සුදුසුකම් හා ඉල්ලුම්පත් කැඳවන අවසන් දිනයට වයස් සීමාව කවරේද;

(iii) උපාධිධාරි අයදුම්කරුවන්ට අවුරුදු 22 - 28 අතර වයස් සීමාවක් පැනවීම සාධාරණ නොවන බැවින්, රැකියා විරහිත උපාධිධාරීන්ට ද ඉල්ලුම් කිරීමට හැකිවන ලෙස එහි උපරිම වයස් සීමාව අවුරුදු 30 දක්වා ඉහළ දැමීමට කටයුතු කරන්නේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

969/’16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.05.19 වැනි දිනට පෙර නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිබූ මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසැල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂයන්හි අලුතින් විවෘතකර ඇති මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව, එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(v) මේ වනවිට නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ඒකපුද්ගල මත්පැන් පරිභෝජනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

983/’16

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ පැවති කාලගුණ විපර්යාස පිළිබඳ පැරිස් සමුළුවේදී ගනු ලැබූ තීරණ කවරේද;

(ii) එකී තීරණ පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ එකඟත්වය පළකර තිබේද;

(iii) එසේ නම්, එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

988/’16

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් පාලනය කරනු ලබන නොරොච්චෝලේ විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ලබාගෙන ඇති සම්පූර්ණ ණය මුදල කොපමණද;

(ii) එම ණය මුදල ගෙවනු ලබන්නේ ලංකා විදුලිබල මණ්ඩලය විසින්ද; එසේ නොමැති නම්, මහා භාණ්ඩාගාරය විසින්ද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ ලාභය ගණනය කිරීමේදී නොරොච්චෝලේ විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ලබාගන්නා ලද ණය සඳහා ගෙවනු ලබන ණය හා පොළී වාරික ගෙවීම සැලකිල්ලට ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

995/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකාපුත්‍ර බැංකුවේ සභාපතිධුරය දරන ලද ලසන්ත ගුණවර්ධන මහතා එම තනතුර දැරීමට නුසුදුසු බව ශ්‍රී ලංකා මහ බැංකුව සහ/හෝ මුදල් මණ්ඩලය විසින් 2016 මාර්තු මස 24 දින තීරණය කළ බවත්;

(ii) ලසන්ත ගුණවර්ධන මහතාට 2016 මාර්තු 24 දිනෙන් පසු ලංකාපුත්‍ර බැංකුවේ සභාපතිධුරය තවදුරටත් දැරීමට නීත්‍යානුකූල අයිතියක් නොමැති බවට නීතිපතිවරයා විසින් නිගමනය කර ඇති බව 2016 සැප්තැම්බර් 02 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඔහුට දැනුම් දුන් බවත්;

(iii) එකී තීන්දු ලබා දීමෙන් පසුද ඔහු බැංකුවේ සභාපති ධුරයේ කටයුතු කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ගුණවර්ධන මහතා සභාපතිධුරයෙන් ඉවත් වූ දිනය කවරේද;

(ii) ඔහු නීති විරෝධීව සභාපතිධුරය දැරූ කාලයේදී ලබා ගත් වැටුප්, දීමනා සහ වෙනත් පහසුකම්වල මූල්‍ය වටිනාකම් කොපමණද;

(iii) එකී මූල්‍ය වටිනාකම ඔහුගෙන් අය කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

(iv) ඔහු විසින් මහජන මුදල් අපහරණය කිරීම පිළිබඳ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණිලි කිරීමට පියවර ගන්නේද;

(v) ඔහු එක්සත් ජාතික පක්ෂයේ කිසියම් නිලයක් දරන්නේද; නැතහොත් දරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1017/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරන ලද පැපිලියානේ සිට පාමංකඩ ඩබ්ලිව්. ඒ. සිල්වා මාවත දක්වා මාර්ගය පළල් කිරීමේ කටයුතු නතර වී ඇති බව දන්නේද;

(ii) මේ හේතුවෙන් හොරණ සිට කොළඹ දක්වා පැමිණෙන රථවාහන විශාල වශයෙන් තදබදයකට ලක්වී ඇති බවත්; පරිසරය දූෂණය වීමද විශාල වශයෙන් සිදුවන බවත් පිළිගන්නේද;

(iii) සුනේත්‍රාදේවී පාරේ පදිංචි සිවිල් ඉංජිනේරු තිස්ස ද සිල්වා යන අය විසින් මේ පිළිබඳව දෙහිවල ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිනිය වන සුනේත්‍රා රණසිංහ මහත්මියගෙන් විමසූ විට ඉදිරි ඉදිකිරීම් කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති බවට කළ ප්‍රකාශය සත්‍යයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට නැවතී ඇති ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 දෙසැම්බර් මස 05 වැනි සඳුදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

835/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 හා 2015 යන වර්ෂයන්හි හෙරොයින්, හෂීස් සහ මර්ජුවානා ආදී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සිදුකර ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අවස්ථාවන්හි අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අත්අඩංගුවට ගත් පුද්ගලයන් සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මුහුදු මාර්ගයෙන්, ගුවන් මාර්ගයෙන් හා වෙනත් මාර්ගයන්ගෙන් මත්ද්‍රව්‍ය රට තුළට ඇතුළුවීම වැළැක්වීමට ගන්නා ක්‍රියාමාර්ග යාවත්කාලීන කර තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත වසර දෙක තුළ මෙම මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ ප්‍රධාන තැරැව්කරුවන් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම පුද්ගලයන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

970/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.05.19 වැනි දිනට මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබූ මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසැල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂයන්හි අලුතින් විවෘතකර ඇති මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව, එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(v) මේ වනවිට මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

989/'16

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විදුලි සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ ජාලය තුළ තාක්ෂණික හා වාණිජමය වශයෙන් සිදුවන විදුලිබල නාස්තියේ ප්‍රතිශතය කොපමණද;

(ii) එම නාස්තිය පිටු දැකීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගනු ලබන පියවර කවරේද;

(iii) එම නාස්තිය අවම කිරීම සඳහා ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් ගනු ලබන පියවර කවරේද;

(iv) ලෝකයේ වෙනත් රටවලට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ විදුලිබල නාස්තිය ඉහළ අගයක් ගන්නා බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

997/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 1972 සිට 2009 දක්වා කාලය තුළ දී දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය හේතුකොට ගෙන;

(i) මියගිය සහ තුවාල ලැබූ සිවිල් ආරක්ෂක බලකායද ඇතුළුව හමුදා සාමාජිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මියගිය සහ තුවාල ලැබූ ත්‍රස්තවාදීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මියගිය සහ තුවාල ලැබූ සාමාන්‍ය ජනතාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1018/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වේරස් ගඟ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සුනේත්‍රාදේවී පාර දක්වා සිදු කර මේ වන විට නතර වී ඇති බවත්;

(ii) ඉදිකිරීම් කටයුතු නතර කිරීම නිසා අවට ප්‍රදේශයේ මදුරු ගහනය විශාල වශයෙන් වැඩි වී ඩෙංගු වැනි මාරාන්තික රෝග ව්‍යාප්ත වී ඇති බවත්;

(iii) සුනේත්‍රාදේවී පාරේ පදිංචි සිවිල් ඉංජිනේරු තිස්ස ද සිල්වා නමැති අය මේ පිළිබඳව මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රූපසිංහ මහතා දැනුවත් කර ඇතත්, ප්‍රතිඵලයක් නොවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් ගැනීමට අපේක්ෂිත පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1026/'16

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1990 සිට 2010 දක්වා ශ්‍රී ලංකාවේ වෙනත් කිසිදු දිස්ත්‍රික්කයක නොතිබූ ලෙස උතුරු පළාතේ පමණක් ගමනාගමනය සඳහා අවසර ලබා ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වූ බවත්;

(ii) මේ හේතුවෙන් සාමාන්‍ය ජනතාව ඇතුළු රාජ්‍ය සේවකයන් පවා කොළඹට පැමිණ නැවත යාමේදී අපහසුතාවන්ට මුහුණ පෑ බවත්;

(iii) 2009 මැයි සිට මාස කිහිපයක් මුලතිව්, කිළිනොච්චි, යාපනය, මන්නාරම සහ වවුනියා යන දිස්ත්‍රික්කවල රාජ්‍ය සේවකයන් සැලකිය යුතු ප්‍රමාණයක් අවතැන්ව සරණාගත කඳවුරුවල රැඳී සිටි බවත්;

(iv) ගමනාගමන අපහසුතා හා ඉහත (iii) හි සඳහන් තත්ත්වයන් හේතු කොටගෙන ඉහත දිස්ත්‍රික්කවල සේවය කළ රාජ්‍ය සේවකයින්ට කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට නොහැකි වූ බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එබැවින්, අංක 2000/2001 දරන චක්‍රලේඛවල ක්‍රියාත්මක දිනය 2001.01.01 වෙනුවට 2011.01.01 ලෙස සංශෝධනය කිරීමටත්;

(ii) එකී දිනයේ සිට වසර 3ක සහන කාලයක් ලබා දීමටත්;

(iii) මෙම කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් නොවීමේ හේතුවෙන් වැටුප් වර්ධකය විලම්බනය කර තිබේ නම්, ඔවුන්ට සහන ලබාදීමටත්;

(iv) එලෙස වැටුප් වර්ධකය විලම්බනය කිරීම වෙනුවට එය අත්හිටුවීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1032/'16

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු හා නැගෙනහිර පැවති යුද ගැටුම් හේතුවෙන් අවතැන් වූ මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2009 පසුව, 2015 ජනවාරි දක්වා කාලය තුළ නැවත පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් සංඛ්‍යාව, මුළු අවතැන් පවුල් සංඛ්‍යාවෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2016 ජනවාරි වනවිට සුභසාධන කඳවුරු තුළ සිටි පවුල් සංඛ්‍යාව හා පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2016 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ නැවත පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත පදිංචි කිරීමට ඉතිරිව සිටින පවුල් සංඛ්‍යාව හා පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නැවත පදිංචි නොකර තවදුරටත් කඳවුරුවල ජනතාව රඳවා තැබීමට හේතු කවරේද;

(v) නැවත පදිංචි කිරීමේ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 දෙසැම්බර් මස 06 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

634/'16

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මූලික සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයන්, විධිමත් බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව වන්නි දිස්ත්‍රික්කයේ සමෘද්ධි නිලධාරීන් ලෙස බඳවාගෙන ඇති බව දන්නේද;

(ii) එලෙස සුදුසුකම් නොමැතිව බඳවාගෙන ඇති සමෘද්ධි නිලධාරීන්ගේ තොරතුරු කවරේද;

(iii) අවිධිමත් ලෙස පත්කර ඇති පුද්ගලයන් සේවයෙන් ඉවත් කර විධිමත් ලෙස අලුතින් නිලධාරීන් බඳවා ගැනීමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

836/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 හා 2015 යන වර්ෂයන්හි නීතිවිරෝධී මත්පැන් සම්බන්ධයෙන් සිදුකර ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එහිදී අත්අඩංගුවට ගත් මත්පැන් වර්ග ලීටර් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙලෙස අත්අඩංගුවට ගත් පුද්ගලයන් නිදහස් වීමෙන් පසු නැවතත් මත්පැන් වෙළඳාමට යොමුවන බවත්;

(ii) එසේ වීමට, දඬුවම් ප්‍රමාණවත් නොවීම සහ එම පුද්ගලයන් වෙනත් ආර්ථික මාර්ග කරා යොමු කිරීමට ක්‍රමවේදයක් නොමැති වීම ඉහත (i)හි තත්ත්වය ඇති වීමට ප්‍රධාන හේතූන් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) නීතිවිරෝධී මත්පැන් වෙළඳාමේ යෙදෙන පුද්ගලයන් එම වෙළඳාමෙන් ඉවත්කර ගැනීමට ක්‍රියාමාර්ග සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

943/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බ්ලූමැන්ඩල් සහ මීතොටමුල්ල යන ස්ථානයන්හි එකතු වී ඇති කසළ දුම්රිය මාර්ගයෙන් ප්‍රවාහනය කර වනාතවිල්ලුව, අරුවක්කලු ප්‍රදේශයේ අක්කර 80ක බිම් ප්‍රදේශයක සනීපාරක්ෂක පිරවුම් සිදු කිරීමට සැලසුම් කළ බවත්;

(ii) එම ව්‍යාපෘතියෙන් කොලොන්නාවේ, මීතොටමුල්ල කසළ හුවමාරු මධ්‍යස්ථානයක් ඉදි කිරීමට, දුම්රිය මාර්ග වැඩි දියුණු කිරීමට සහ උපකරණ මිල දී ගැනීමටත් සැලසුම් කළ බවත්;

(iii) 2015 වර්ෂය සඳහා වූ අයවැයෙන් මෙම ව්‍යාපෘතිය සඳහා, රුපියල් මිලියන 14,000ක් වෙන් කර තිබුණු බවත්;

(iv) 2014 වර්ෂය අගදී ව්‍යාපෘතියේ පළමු අදියර 02හි ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුනු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය නතර කර තිබේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

990/'16

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මතුගම ප්‍රාදේශීය සභාවට අයත් බටුමුල්ල කන්ද රක්ෂිතයට අයත් සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණයෙන් බටුමුල්ල කන්දේ විහාරස්ථානයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් ප්‍රමාණය, විහාර දේවාලගම් පනත යටතේ මැනුම්කර ඔප්පුවකින් නිරවුල් කර තිබේද;

(iv) එසේ නම්, විහාරස්ථානයට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බටුමුල්ල කන්දේ බුදුපිළිමයක් ඉදිකරන ලද්දේ ප්‍රාදේශීය සභාව සතු රක්ෂිතයේද; නොඑසේ නම්, බටුමුල්ල කන්ද විහාරස්ථානය සතු ඉඩමේද;

(ii) බුදුපිළිමය ඉදිකරන ලද්දේ රක්ෂිතයේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iii) මෙම ඉඩමෙන් පර්චස් 40 ක ඉඩම් ප්‍රමාණයක් සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා පමණක් වෙන්කර ඇති අතර, ඒ හැර වෙනත් ඉදිකිරීම් සඳහා කිසියම් පුද්ගලයෙකුට ලබා දී තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1027/'16

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007.07.01 දිනයෙන් පසු රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින් අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් සිංහල භාෂාව විෂයයක් ලෙස සමත් විය යුතු බවත්;

(ii) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබන වාචික පරීක්ෂණයෙන් ද සමත් විය යුතු බවත්;

(iii) මෙම පරීක්ෂණය නිශ්චිත කාල සටහනකට අනුව නොපවත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පරීක්ෂණය කාල සටහනකට අනුව පැවැත්වීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, උතුරු පළාත් සභාවට හෝ දිස්ත්‍රික් පරිපාලනයට මෙම වගකීම භාර දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1033/'16

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014 අයවැය මඟින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම යටතේ පාලම් 537 ඉදිකිරීම සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 7,377ක මුදලින් මෙම වර්ෂය තුළ,

(i) වැඩ අවසන් කර ඇති;

(ii) වැඩ නිම කරමින් පවතින;

(iii) ඉදිකිරීමට නියමිත;

පාලම් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පාලම් වැඩසටහන ක්‍රියාත්මක වන පටිපාටිය කවරේද;

(ii) ඒ සඳහා ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක කර තිබේද;

(iii) ඉදිකිරීම් සිදුකරනු ලබන ආයතන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති ග්‍රාමීය පාලම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාලම් පිහිටි ස්ථාන කවරේද;

(iii) මෙම වැඩසටහන ක්‍රියාත්මක වී නොමැති නම්, එයට හේතු කවරේද;

(iv) එම වැඩසටහන සඳහා වෙන් කරන ලද මුදලට සිදු වූයේ කවරක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1039/'16

ගරු කනක හේරත් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී ජීවනාධාර දීමනා ලබා දී ඇති ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 වර්ෂයේදී ආබාධ සහිත පුද්ගලයන් සඳහා ජීවනාධාර ලෙස ලබා දී ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016 සැප්තැම්බර් 30 වනවිට අලුතින් ඉල්ලුම් කළ ආබාධ සහිත පුද්ගලයන් සඳහා දීමනා ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2015 වර්ෂයේ සිට මෙම දීමනා නොලැබෙන ආබාධ සහිත පුද්ගලයන් සිටින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, කෑගල්ල දිස්ත්‍රික්කයේ සිටින එවැනි ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුද්ගලයන්ට මෙම වර්ෂය තුළදී දීමනා ලබාදීම වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 දෙසැම්බර් මස 07 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

843/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්හි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු විහාරස්ථාන කවරේද;

(ii) එම දිස්ත්‍රික්කවල පිහිටි බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විහාරස්ථාන කවරේද;

(iii) මෙම විහාරස්ථානයන් නිදන් හොරුන්ගෙන් හා සංවිධානාත්මක අපරාධකරුවන්ගෙන් ආරක්ෂා කර ගැනීමට පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

(v) 2012 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ මෙම විහාරස්ථානවලට උක්ත පුද්ගලයන්ගෙන් හානි සිදුවූ බවට වාර්තා වී තිබේද;

(vi) එසේ නම්, ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම විහාරස්ථාන සංවර්ධනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

864/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සීමාසහිත ලංකා පොහොර සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු ලෙස චන්දන පැල්පිට මහතා සේවය කරන්නේද;

(ii) එසේ නම්, ඔහුගේ වැටුප, දීමනා සහ ලබාදී ඇති වාහන සඳහා මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් 2015 නොවැම්බර් 06 දාතමින් පෙත්සම් අංක PCI/52/2015 යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් එවා තිබේද;

(iv) එම ලිපියේ සඳහන් ආකාරයට වන්දන පැල්පිට මහතා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස සේවය කළ අවධියේ සිදුකර ඇති බරපතල මූල්‍ය වංචා කවරේද;

(v) එම මූල්‍ය වංචාවන් සඳහා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ කවරේද;

(vi) එම නිර්දේශ ක්‍රියාත්මක කළ දිනය කවරේද;

(vii) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක නොකළේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

899/'16

ගරු විමල් රාජපක්ෂ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරවිල සහ යෝධකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථාන බලප්‍රදේශ මඟින් පොහොර සහනාධාරය සඳහා ඉල්ලුම්කර ඇති ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගොවීන් අතරින් පොහොර සහනාධාර මුදල් ලබාදුන් ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iii) පොහොර සහනාධාර මුදල් ලබාදීමට නියමිත ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) පොහොර සහනාධාර මුදල් නොලැබුනු ගොවීන් සඳහා මුදල් ලබාදීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

914/'16

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ගේ සහභාගිත්වයෙන් මේ දිනවල සමීක්ෂණයක් පවත්වන්නේද;

(ii) අදාළ සමීක්ෂණය සමස්ත දිවයිනෙහිම ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එම සමීක්ෂණයේ අරමුණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ සඳහා සහභාගී වී ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමීක්ෂණය සඳහා ගතවන කාලය කොපමණද;

(iii) ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් මුදල් වෙන් කර තිබේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

998/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 1972 සිට 2009 දක්වා කාලය තුළ දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය හේතුකොට ගෙන මියගිය සහ තුවාල ලැබූ ශ්‍රී ලංකා පොලීසියේ සාමාජිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1028/'16

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හේතුවෙන් 1980 වසරට පෙර රාජ්‍ය සේවකයන් විශාල ප්‍රමාණයකට රැකියා අහිමි වූ බවත්;

(ii) ඊට සහන සැලසීමේ අරමුණින් 1991.08.23 වැනි දින අංක 37/91 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ නිකුත්කරන ලද බවත්;

(iii) එවකට රටේ පැවැති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් බොහෝ පිරිසකට එහි අපේක්ෂිත අරමුණ ඉටුකරගත නොහැකි වූ බවත්;

(iv) පීඩාවට පත් පුද්ගලයන් සිය ගණනක් කිසිදු සහනයක් නොලබා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත චක්‍රලේඛය වඩාත් නම්‍යශීලී ආකාරයෙන් නිකුත් කරන්නේද;

(ii) පීඩාවටපත් රාජ්‍ය සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් වෙත සහන සැලසීම පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1040/'16

ගරු කනක හේරත් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජල නල දීර්ඝ කිරීම් සහ නව සම්බන්ධතා ලබා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට ලබා දී ඇති ජල නල දීර්ඝ කිරීම් සහ නව සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වල්ගම හන්දියේ සිට දොඹේමඩ මාර්ගයේ ජල දිගුව, කටුපිටිය මාර්ගයේ ජල දිගුව, නාරම්බැද්ද මාර්ගයේ ජල දිගුව, පරපේ මාර්ගයේ ජල දිගුව සහ මුවපිටිය හලාගිරිය මාර්ගයේ ජල දිගුව දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2016 දෙසැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

718/'16

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි,

(i) පිහිටි එකම දෙමළ මාධ්‍ය ජාතික පාසල වන අ/ සහිරා විද්‍යාලය නොසලකා හැරීම හේතුවෙන් විවිධ අඩුපාඩු සහිත වන බවත්;

(ii) "පාසල් 1000" වැඩසටහනට කාඩාණ්ඩුගම, ජායා මුස්ලිම් මහා විද්‍යාලය හා කහටගස්දිගිලිය මුස්ලිම් මහා විද්‍යාලය ඇතුළත් කර ඇති නමුත් තාක්ෂණ විද්‍යාගාර හැර වෙනත් කිසිදු පහසුකමක් මේ වනවිට ලබා දී නොමැති බවත්;

(iii) සිංහල සහ දෙමළ මාධ්‍ය පාසල්වල ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි සහ තාක්ෂණවේදය වැනි විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ (i) හි සඳහන් පාසලෙහි,

(i) උසස් පෙළ විද්‍යා අංශයේ පවතින ගුරු හිඟය සපුරනු ලබන;

(ii) නව ගොඩනැගිල්ලක් ලබා දෙනු ලබන;

(iii) විදුහල්පතිවරයා සඳහා කාර්යාලයක් සහ ශ්‍රවණාගාරයක් ලබා දෙනු ලබන;

(iv) පානීය ජල පිරිපහදු යන්ත්‍රයක් ලබා දෙනු ලබන;

දිනය කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ (ii) සඳහන් පාසල් සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබාදෙනු ලබන;

(ii) ඉහත අ (iii) හි සඳහන් පුරප්පාඩු පුරවනු ලබන;

දිනය කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

844/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කතරගම, නල්ලූර්, මුන්නේශ්වරම්, තිරුකෝනේෂ්වරම් හා තිරුකේතීශ්වරම් යන ස්ථානයන්හි පිහිටි ශ්‍රී ලාංකීය හින්දු ආගමිකයන්ගේ ප්‍රධාන පූජනීය ස්ථාන වන්දනා කිරීමට විදේශිකයන්ද පැමිණෙන බවත්;

(ii) මෙම පූජනීය ස්ථානයන්හි විදේශීය සංචාරකයන්ට හා දේශීය සංචාරකයන්ට ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත්;

(iii) මෙම ස්ථාන සංවර්ධනය කිරීමෙන් රටේ ආර්ථිකයට ද විශාල දායකත්වයක් ලබාගත හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම පූජනීය ස්ථාන සංවර්ධනයට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

930/'16

ගරු වන්දිම ගමගේ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට අයත් රුපියල් බිලියන 03ක මුදලක් අයථා ලෙස පරිහරණය වී ඇති බවට වූ චෝදනාව පිළිබඳ පරීක්ෂණ කටයුතු අවසන් වී තිබේද;

(ii) මණ්ඩලයට අයත් මුදල් අයුතු ලෙස පරිහරණය වන බව නිරීක්ෂණය කිරීමට මණ්ඩලයේ විගණන නිලධාරින් අසමත් වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ලංකා විදුලිබල මණ්ඩලය සතු මුදල් පෞද්ගලික සමාගමක් හරහා ආයෝජනය කිරීමට තීරණය කරන අවස්ථාවේ,

(i) මණ්ඩලයේ සභාපති;

(ii) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්;

(iii) විෂය භාර අමාත්‍යවරයා;

කවුරුන්ද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ)හි සඳහන් ආයෝජනය පිළිබඳව තීරණය කරන ලද දිනය කවරේද;

(ii) එකී ආයෝජනයේ ඵලදායිතාව පිළිබඳව නිර්දේශ කරන ලද නිලධාරින්ගේ නම් කවරේද;

(iii) ඉහත (ii)හි සඳහන් නිලධාරින්ට එරෙහිව මණ්ඩලය විසින් ගෙන ඇති විනයානුකූල පියවර කවරේද;

(iv) ඉහත (ii)හි සඳහන් නිලධාරින්ට එරෙහිව ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය ප්‍රකාරව කටයුතු කර තිබේද;

(v) ඉහත (iii) සහ (iv)ට අනුව කටයුතුකර නොමැති නම්, එයට හේතු කවරේද;

(vi) ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ක්‍රියාදාමය ශක්තිමත් කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1000/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 මැයි 19 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 ජනවාරි 08 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2016 සැප්තැම්බර් 30 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1029/'16

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුද්ධය පවතින අවස්ථාවේ ඇතිවූ අසාමාන්‍ය වටපිටාව හේතුවෙන් රාජ්‍ය සේවකයන් බොහොමයක් විදේශ රටවල රැකවරණය පැතූ බවත්;

(ii) ඔවුන්ට සහන සැලසීම සඳහා 2006.02.16 දිනැති අංක 4/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය නිකුත්වන අවස්ථාවේ යුද්ධය ඉතාමත් දරුණු තත්ත්වයක පැවැති බවත්;

(iii) 2013.10.31 දිනැති අංක 4/2006(1) දරන චක්‍රලේඛයෙන් මෙකී සහන ලබාගැනීම පිණිස අභියාචනා කිරීම සඳහා ලබාදී තිබුනේ මාස දෙකක කෙටි කාලයක් බැවින්, බොහෝ දෙනෙක් ඒ පිළිබඳව දැනුම්වත්වී නොසිටි බවත්;

(iv) අභියාචනා ප්‍රතික්ෂේප වනවිට ආරක්ෂක අංශයේ වාර්තා ඉල්ලා සිටින ලද බවත්;

(v) මෙම තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් බොහෝදෙනෙකුට සහන නොලැබුණු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ පවතින සාමකාමී වටපිටාව තුළ මාස 5ක පමණ කාලයක් ලබා දී ඒ සම්බන්ධයෙන් ප්‍රචාරය කිරීමටත්;

(ii) පීඩාවට පත් පුද්ගලයන්ගේ නියෝජනයක් සහිතව පරීක්ෂණ කමිටුවක් පත්කිරීමටත්;

(iii) ආරක්ෂක අංශයේ මැදිහත්වීම නතර කිරීමටත්;

(iv) කඩිනමින් සහන සැලසීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1034/'16

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂය වෙනුවෙන් "ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය" යටතේ ක්‍රීඩාංගණ 11ක් හා ක්‍රීඩා සංකීර්ණ 10ක් ඉදිකිරීම සඳහා අමාත්‍යාංශයට වෙන් කර ඇති රුපියල් මිලියන 1,348ක මුදලින් මේ වනවිට ඉදිකර ඇති ක්‍රීඩාංගණ හා ක්‍රීඩා සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් ක්‍රීඩාංගණ හා ක්‍රීඩා සංකීර්ණ කවරේද;

(iii) මෙම වර්ෂය තුළ වැඩ අවසන් කර ක්‍රීඩකයන්ගේ පරිහරණයට ලබාදිය හැකි ක්‍රීඩාංගණ හා ක්‍රීඩා සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ග්‍රාමීය ක්‍රීඩකයන් සඳහා ක්‍රීඩා පහසුකම් සැපයීම වෙනුවෙන් වෙන් කරන ලද රුපියල් මිලියන 320ක මුදලින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කවරේද;

(ii) "ක්‍රීඩා ශක්ති" වැඩසටහන යටතේ ක්‍රීඩා දක්ෂතා සංවර්ධනය සඳහා මෙම වර්ෂය තුළ හඳුනාගෙන ඇති ක්‍රීඩකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ගම්පහ දිස්ත්‍රික්කය සඳහා ඉදිකිරීමට යෝජිත මීරිගම ඩී. එස්. සේනානායක විද්‍යාලීය ක්‍රීඩාංගණයේ ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1041/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සපුමල්තැන්න, වැලිඔය ප්‍රදේශයේ නැවත පදිංචි කරන ලද රජයේ නිලධාරින් සඳහා නිවාස ණය ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරින් අතරින් හමුදා සේවයේ නියුතු 13 දෙනෙකුට නිවාස ණය ලබාදීමට කටයුතු නොකළේ මන්ද;

(iii) එම 13 දෙනා සඳහාද නිවාස ණය ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 දෙසැම්බර් මස 09 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

716/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වතුකරයේ පවුල් දෙලක්ෂ පනස් දහසක් සඳහා පර්චස් 7 බැගින් බෙදා දීමට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එක් එක් වතුයායේ සිටින ඉඩම් අවශ්‍ය පවුල් සංඛ්‍යාව අනුව අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සහ එම වතුවල ඇති මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් වතුයාය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉඩම් අයිතිය පවුලේ අය අතර පමණක් පැවැරීමේ නීතියකට යටත්ව ඉඩම් ලබා දෙනු ලැබුවහොත් කම්කරු පවුල් එම ඉඩම් ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කරුණටම අදාළව, 2016.05.06 දින මවිසින් අසන ලද ප්‍රශ්නයට ලබාදුන් පිළිතුර අනුව, නිවාස ඉදිකිරීමට සුදුසු ඉඩම් බොහොමයක තේ වගා කර තිබීම හේතුවෙන්, තේ වගාව තිබෙනතුරු වතුකරයේ ජනතාවට ඉඩම් ලබා දීමට නොහැකි වන බවත්;

(ii) වසර 100කට වැඩි කාලයක් වතුවල පදිංචි වී සිටින මෙම කම්කරු ජනතාවට ඔවුන් පදිංචි නිවසට ඉදිරියෙන් සහ පසුපසින් පර්චස් 7කින් සමන්විත වන පරිදි ඉඩම් ලබාදීමේ හැකියාවක් තිබේද;

(iii) තේ වගාව සඳහා බෑවුම් ප්‍රදේශ යොදාගෙන තැනිතලා ප්‍රදේශ වතු ජනතාවට ලබා දීමේ හැකියාවක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

845/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිංහල මිශ්‍ර භාෂාව කථා කරන, ආදිවාසීන් ජීවත් වන ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(ii) දෙමළ මිශ්‍ර භාෂාව කථා කරන ආදිවාසීන් ජීවත් වන ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iii) දැනට ජීවත්ව සිටින මුළු ආදිවාසීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආදිවාසී ජනතාවට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සෞඛ්‍ය යන මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමේ අයිතිය රජය විසින් තහවුරු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවයන් හා පාරම්පරික උරුමයන් රැකගෙන ජීවත්වීම සඳහා රජය අනුග්‍රහයන් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

865/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ශ්‍රී ලංගම ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ඩිපෝව මඟින් දිනකට ධාවනය කරනු ලබන බස් රථ සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම ඩිපෝ අතරින් දැනට ලාභ හා පාඩු ලබන ඩිපෝ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංගම ඩිපෝවල සේවය කරන මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(v) බදුල්ල දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංගම ඩිපෝවල වර්තමානයේ පවතින රියදුරු, කොන්දොස්තර, කාර්මික ශිල්පී හිඟය සහ බස්රථ අමතර කොටස් නොමැති වීම යන ගැටලු විසඳා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

971/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.05.19 වැනි දිනට වව්නියාව දිස්ත්‍රික්කයේ තිබූ මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසැල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂයන්හි අලුතින් විවෘතකර ඇති මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව, එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(v) මේ වනවිට වව්නියාව දිස්ත්‍රික්කය තුළ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1001/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ගොවිජන බැංකුව නමින් බැංකුවක් ක්‍රියාත්මක වන බවත්;

(ii) එම බැංකුව 1988 අංක 30 දරන බැංකු පනත හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ලියාපදිංචි කර නොමැති බවත්;

(iii) ලියාපදිංචි නොකර ජනතාවගෙන් තැන්පතු භාර ගැනීම නීති විරෝධී බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ගොවිජන බැංකුව ලියාපදිංචි නොකිරීමට හේතු කවරේද;

(ii) එම බැංකුව ලියාපදිංචි කිරීමට හෝ අහෝසි කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 දෙසැම්බර් මස 10 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

846/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලීනව පදිංචිව සිටින චීන සම්භවයක් සහිත පුද්ගලයන් ජීවත්වන කොළඹ හා ඒ අවට ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(ii) එම ප්‍රදේශවල දැනට ජීවත්වන චීන සම්භවයක් සහිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම පුද්ගලයන් ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රදේශවල ජීවත්වන බවට වාර්තාවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ජනතාවට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සෞඛ්‍ය යන මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමේ අයිතිය රජය විසින් තහවුරු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවයන් හා පාරම්පරික උරුමයන් රැකගෙන ජීවත්වීම සඳහා රජය අනුග්‍රහයන් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

972/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.05.19 වැනි දිනට කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිබූ මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසැල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂයන්හි අලුතින් විවෘතකර ඇති මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව, එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(v) මේ වනවිට කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1005/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.10 දින සිට 2016.09.30 දින දක්වා කුලී පදනම මත ලබා ගෙන ඇති ගොඩනැගිලිවල අමාත්‍යාංශ සහ අමාත්‍ය කාර්යාල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ කවරේද;

(ii) එකී ගොඩනැගිලිවල මාසික කුලිය වෙන් වෙන් වශයෙන් සහ සමස්ත එකතුවක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1035/’16

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) “කුඩා හා මධ්‍ය පරිමාණ ධීවර කර්මාන්තය සඳහා නවීණ තාක්ෂණය හඳුන්වා දීම” යන වැඩසටහන යටතේ, 2016 අයවැය මඟින් වෙන් කරන ලද රුපියල් මිලියන 1,600 ක මුදල, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ අමාත්‍යාංශය වෙත ලැබී තිබේද;

(ii) එසේ නම්, එම මුදල් ඉහත ව්‍යාපෘති කටයුතු සඳහා යොදවා තිබේද;

(iii) මුදල් යොදවා ඇති ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, ධීවර කර්මාන්තය ප්‍රධාන ස්ථානයක් ගන්නා මීගමුව ප්‍රදේශයේ ධීවර කාර්මිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද;

(ii) එමඟින් ධීවරයින්ගේ සාමාන්‍ය මාසික ආදායම ඉහළ ගොස් තිබේද;

(iii) එසේනම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?